**සෞඛ්‍ය හා වෛද්‍ය සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - 2021**

-----------------------------------------------------------------------

සෞඛ්‍ය හා වෛද්‍ය සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය අතර 2017 නොවැම්බර් 30 දින පැවැත් වූ සාකච්ඡාවල සාකච්ඡා සටහන්වල ඇමුණුම II හි 12 වන වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළයුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය**

ණය ගිවිසුමට අනුව, සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය, වර්තමානයේ සෞඛ්‍ය අමාත්‍යාංශය මෙම ව්‍යාපෘතියේ විධායක නියෝජිතායතනය වන අතර ව්‍යාපෘති කළමනාකරණ ඒකකය ව්‍යාපෘතියේ ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. මෙම ව්‍යාපෘතියේ අරමුණු වන්නේ තෘතියික රෝහල්වල වෛද්‍ය පහසුකම් සහ උපකරණ සහ ඒ ආශ්‍රිත පහසුකම් වැඩිදියුණු කිරීම මගින් බෝ නොවන රෝග, විශේෂයෙන්ම හෘද කන්තුකවාහිනී රෝග හඳුනා ගැනීම සහ ප්‍රතිකාර කිරීම සඳහා වෛද්‍ය සේවාව වැඩිදියුණු කිරීම සහ එමගින්, ව්‍යාපෘති ප්‍රදේශයේ ජීවත්වන ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය නංවාලීමට දායක වීමයි. ණය ගිවිසුම් සහ පවත්වන ලද සාකච්ඡාවල සාකච්ඡා සටහන් අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රුපියල් මිලියන 16,559 කට සමාන වූ ජපන් යෙන් මිලියන 11,352 ක් වන අතර ඉන් රු. මිලියන 15,519 කට සමාන වූ ජපන් යෙන් මිලියන 10,639 ක් මූල්‍යකරණය කිරීමට ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය එකඟ විය. ඉතිරි මුදල වන රු. මිලියන 1,040 මූල්‍යකරණය කිරීමට ශ්‍රී ලංකා රජය අපේක්ෂා කරයි. මෙම ව්‍යාපෘතියේ කටයුතු 2018 ඔක්තෝබර් 20 වන දින ආරම්භ කරන ලද අතර 2025 ඔක්තෝබර් 20 දින වන විට එම ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමට සැලසුම් කර තිබුණි.

**1.3 මතය**

2021 දෙසැම්බර් 31 දිනට සෞඛ්‍ය හා වෛද්‍ය සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ වියදම් ප්‍රකාශය හා එහි මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය සහ සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.4 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගනන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අනුකූලව පිළියෙල කිරීම හා සත්‍ය සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍යප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍යප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවයමෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරනලදී .වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම් කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශන වල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුනු පිලිබඳවපාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| ගිණුම්කරණ අඩුපාඩුව / විගණන නිරීක්ෂණය | මුදල රු. | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දිනට ජපන් ණය දෙන ආයතනයේ ණය ශේෂය එම දිනයේ **ශ්‍රී ලංකා** රුපියල් අගයට පරිවර්තනය කර නොතිබූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්වය ප්‍රකාශයේ | - | JICA කෙටි ලැයිස්තුගත උපදේශන සමාගම්වල මගපෙන්වීම යටතේ, අපි JICA මාර්ගෝපදේශ සහ ලේඛන පටිපාටිය සමඟ ටෙන්ඩර් සහ විවෘත ඇගයීම් කැඳවා එක් ජපන් උපදේශන සමාගමක් තෝරා ගත්තෙමු. | සමානාත්මතා ගැලපීම මූල්‍ය ප්‍රකාශනයේ හෙළිදරව් කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| | දැක්වෙන ණය ශේෂය සහ සංවර්ධන වියදම් ශේෂය අවතක්සේරු කර තිබුණි. | එබැවින් දෙපාර්ශවයම 2020 වසරේ උපදේශන ගිවිසුමට අත්සන් තැබූහ. කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් උපදේශනය 2020 මැද භාගයේ වැඩ ආරම්භ විය. ණය ගිවිසුම 2018 දී අත්සන් කළත්, උපදේශන ගිවිසුම අත්සන් කළේ 2020 දී ය. විගණන විමසුමේ මෙන් 2018 දී යෙන් එකක් = රුපියල් 1.4699 ක් සහ 2020 මැද භාගයේදී යෙන් එකක් = රුපියල් 1.722 කි. රුපියලේ අගය දවසින් දවස පහත වැටෙමින් තිබුණා. අවකාශය සීමා කිරීම හේතුවෙන් විනිමය අනුපාතිකය එදිරිව බලපාන ආකාරය මූල්‍ය ප්‍රකාශනයේ හෙළි කළ නොහැකි අතර යෙන් ගෙවීමේදී (90%), විනිමය අනුපාතිකය ණය කළමනාකරණය සඳහා එතරම් ප්‍රයෝජනවත් නොවේ. ණය කළමනාකරණය විදේශ සම්පත් දෙපාර්තමේන්තුව මගින් සිදු කෙරේ. අපි රුපියල පරිවර්තනය කරන්නේ ගිණුම් සකස් කිරීම සහ වැය ලේඛන කළමනාකරණය සඳහා පමණයි. | |

## 2.2 නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| අංකය | නීතිරීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම / විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | සාකච්ඡා සටහනේ ඇමුණුම ii හි 12 ඡේදය | සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා සහ ජපන් ණය දෙන ආයතනය අතර 2017 නොවැම්බර් 30 වන දින එළඹී සාකච්ඡා සටහනට අනුව ව්‍යාපෘතියේ මූල්‍ය විගණනය සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් සිදු කළ යුතු බව දක්වා තිබේ. කෙසේ නමුත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොමැති බව නිරීක්ෂණය විය. | අභ්‍යන්තර විගණනය සිදු කරනු ලබන්නේ සෞඛ්‍ය අමාත්‍යාංශය විසිනි. කරුණාකර පහත සඳහන් ලේඛන පරිශීලනය කරන්න.<br>[2] අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂකගේ 2022 සැප්තැම්බර් 26 දිනැති ලිපිය<br>• අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂකගේ 2022 ඔක්තෝබර් 12 දිනැති ලිපිය සහ රැස්වීම් සටහන්<br>• ව්‍යාපෘති අධ්‍යක්ෂගේ 2023 ජනවාරි 30 දිනැති ලිපිය | නියමයන් අනුගමනය කිරීමට පියවර ගත යුතු ය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | මුදල් රෙගුලාසි අංක 756 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය පත් කිරීම සෑම වසරකම දෙසැම්බර් 15 හෝ ඊට පෙර සිදු කළ යුතු වුවද, රු. මිලියන 5 ක ඉන්වෙන්ට්‍රි අයිතම පරීක්ෂා කිරීමට සමීක්ෂණ මණ්ඩලයක් පත්කර නොතිබුණි. | පහත ලියකියවිලි ඔබගේ දැන ගැනීම සඳහා ඉදිරිපත් කරමි.<br>• 2021 ජනවාරි 12, 2022 පෙබරවාරි 22 සහ 2022 අගෝස්තු 22 දිනැති ව්‍යාපෘති අධ්‍යක්ෂගේ ලිපිය<br>• 2020 ජූලි 07 දිනැති සෞඛ්‍ය අමාත්‍යාංශයේ ගණකාධිකාරී (සැපයුම්) විසින් නිකුත් කරන ලද උපදෙස් ලිපිය<br>• සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රධාන මූල්‍ය නිලධාරී II විසින් නිකුත් කරන ලද 2022 අප්‍රේල් 08 දිනැති උපදෙස් ලිපිය<br>අවාසනාවකට මෙන්, වාර්ෂික සමීක්ෂණය සඳහා සමීක්ෂණ මණ්ඩලය පැමිණියේ නැත. | මුදල් රෙගුලාසියේ සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතු ය. |

**3. භෞතික කාර්යසාධනය**

**3.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික ප්‍රගතිය**

**(අ)**

| **සංරචකය** | **ක්‍රියාකාරකම** | **2021 දෙසැම්බර් 31 දිනට** | | **ප්‍රමාදය/ විගණන නිරීක්ෂණය** | **ප්‍රමාදයට හේතු** |
|---|---|---|---|---|---|
| | | **අපේක්ෂිත භෞතික කාර්යසාධනය**<br>**ප්‍රතිශතය** | **ළඟා කරගෙන ඇති කාර්යසාධනය**<br>**ප්‍රතිශතය** | | |
| - | බදුල්ල පළාත් මහ රෝහලේ මහල් 10 කින් යුත් ගොඩනැගිල්ල ඉදිකිරීම | 100 | ශුන්‍යයි. | සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත බදුල්ල පළාත් මහ රෝහලේ මහල් 10 කින් යුත් ගොඩනැගිල්ලේ ඉදිකිරීම 2018 වසරේ රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට පිරිනමන ලද අතර එය 2021 අප්‍රේල් මාසයේදී අවසන් කිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත් 2023 මාර්තු වන විටත් ඉදිකිරීම් අවසන් කර නොතිබුණි. රු. මිලියන 1,271 ක උපකරණ සපයා සවිකිරීමට සැලසුම් කර තිබුණද ඉහත ඉදිකිරීම් නිම නොතිබීම හේතුවෙන් එය ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි. | අවශ්‍ය ප්‍රතිපාදන නොලැබීම. |

| | |
|---|---|
| **කළමනාකරණයේ ප්‍රතිචාරය** | බදුල්ල පළාත් මහලේ මහල් දහයකින් යුත් ගොඩනැගිල්ල රජයේ මුදල් යොදා සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් ඉදිකරනු ලැබේ. මෙම ඉදිකිරීම් ප්‍රමාදයට සෞඛ්‍ය හා වෛද්‍ය සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය වගකිව යුතු නොවේ. කෙසේ වෙතත් බදුල්ල ඉදිකිරීමේ ප්‍රගතිය වැඩිදියුණු කිරීම සඳහා ව්‍යාපෘති කළමනාකරණ ඒකකය සෞඛ්‍ය අමාත්‍යාංශය, මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශය සහ මුදල් අමාත්‍යාංශය සමඟ සම්බන්ධීකරණය කර ඇත. |
| **විගණකගේ නිර්දේශයන්** | අපේක්ෂිත ප්‍රගතිය ළඟා කර ගැනීමට ක්‍රියා කළ යුතුය. |

**(ආ)**

| **සංරචකය** | **ක්‍රියාකාරකම** | **2021 දෙසැම්බර් 31 දිනට** | | **ප්‍රමාදය/ විගණන නිරීක්ෂණය** | **ප්‍රමාදයට හේතු** |
|---|---|---|---|---|---|
| | | **අපේකෂිත භෞතික කාර්යසාධනය** | **ළඟා කරගෙන ඇති කාර්යසාධනය** | | |
| | | **ප්‍රතිශතය** | **ප්‍රතිශතය** | | |
| - | දේශිය ප්‍රතිපාදන උපයෝජනය | 19.2 | 9.8 | ව්‍යාපෘතිය සඳහා රජයේ දායකත්වය රුපියල් මිලියන 790ක් වුවද 2019 සිට 2021 දක්වා උපයෝජනය කර ඇත්තේ රුපියල් මිලියන 78.4ක් පමණි. | වාර්ෂික ඇස්තමේන්තු ගත ප්‍රතිපාදන නොලැබීම. |

| | |
|---|---|
| **කළමනාකරණයේ ප්‍රතිචාරය** | රජයේ අයවැය ලේඛනවල දැක්වෙන ප්‍රතිපාදන අනුව නොව ව්‍යාපෘතියට ලැබෙන මුදල් ප්‍රමාණය අනුව උපයෝජනය සිදු කෙරේ. ඒ අනුව ලැබුණු කොටසෙහි භාවිතය පහත දැක්වේ.<br>• 2019 = 95.9 %<br>• 2020 = 97.1 %<br>• 2021 = 97.8 %<br>• 2022 = 98.1 % |
| **විගණකගේ නිර්දේශයන්** | අපේක්ෂිත ප්‍රගතිය ළඟා කර ගැනීමට ක්‍රියා කළ යුතුය. |

**3.2 කොන්ත්‍රාත් පරිපාලනය**

| **අංකය** | **විගණන නිරීක්ෂණය** | **කළමනාකරණයේ ප්‍රතිචාරය** | **විගණකගේ නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | ත්‍රිකුණාමලය දිස්ත්‍රික් මහ රෝහල, මහනුවර කුරුණෑගල සහ අනුරාධපුර ශික්ෂණ රෝහල්වල ඉදිකිරීම් සහ කොළඹ, කළුතර, පේරාදෙණිය MLT පුහුණු පාසල්වල මෙන්ම කොළඹ ජීව වෛද්‍ය ඉංජිනේරු අංශය සඳහා උපකරණ සපයා සවිකිරීම 2019 | ණය අනුමත කිරීමට පෙර ව්‍යාපෘති ක්‍රියාකාරී සැලැස්ම සකස් කර තිබුණි. JICA විසින් 2018 ඔක්තොම්බර් 19 දින ණය අනුමත කරන ලදී. ව්‍යාපෘති කළමනාකරණ ඒකකය 2019 ජනවාරි 01 දින පිහිටුවන ලදී. නීතිපති දෙපාර්තමේන්තුවේ මාස පහක ප්‍රමාදයක් සහ ලොව පුරා පැතිර යන COVID-19 වසංගතය හේතුවෙන් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ කාලසටහන වෙනස් කරන ලදී. | අපේක්ෂිත ප්‍රගතිය ළඟා කර ගැනීමට ක්‍රියා කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| | ක්‍රියාකාරී සැලැස්මට අනුව ඉටු කිරීමට නියමිත තිබූ නමුත්, විගණිත දිනය වන විට අවම වශයෙන් ටෙන්ඩර් කැඳවීම හෝ සිදු කර නොතිබුණි. | • පැකේජ 1, 2, සහ 3 සම්බන්ධ සියලුම ලියකියවිලි (විස්තරාත්මක සැලසුම් සහ ටෙන්ඩර් ලේඛන) 2022 ජුනි 17 දින එකගතාව සඳහා JICA වෙත ඉදිරිපත් කර ඇත.<br>• කොන්ත්‍රාත් ගිවිසුම සෞඛ්‍ය අමාත්‍යාංශය සහ ජපානයේ ටෝකියෝ හි SIRIUS ආයතනය අතර එකඟතාව සඳහා JICA වෙත 2022 ජුනි 16 වන දින යවන ලදී.<br><br>නමුත් JICA විසින් ඉහත ඉල්ලීම් සඳහා මෙතෙක් (ජපානයේ ආර්ථික ප්‍රතිපත්තිය මත පදනම්ව) එකඟතාවයක් නිකුත් කර නොමැත. එබැවින් ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඉදිරියට ගෙන යාමට නොහැකි විය. | |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසන් වන විට, ව්‍යාපෘතිය මගින් ක්‍රියාත්මක කරන කොන්ත්‍රාත්තු සම්බන්ධ ක්‍රියාවලියේ අදාළ මූලික කටයුතු සිදු කර ඇතත් ලංසු කැඳවීමට කටයුතු කර නොතිබුණි. කෙසේ නමුත් ව්‍යාපෘති උපදේශනය සඳහා යෙන් මිලියන 872ක් වෙන් කර තිබුණි. | උපදේශන කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර ඇත. සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය රසායනාගාර තාක්ෂණ පුහුණු පාසල් සහ ජෛව වෛද්‍ය ඉංජිනේරු සේවා අංශය සඳහා උපකරණ සැපයීම සහ ස්ථාපනය කිරීම සඳහා ටෙන්ඩර් ගිවිසුමක් (ප්‍රසම්පාදන පැකේජ අංක 06) අත්සන් කරන ලදී. ඉදිකිරීම් පැකේජවල සියලුම සවිස්තරාත්මක සැලසුම් සහ ටෙන්ඩර් ලියකියවිලි සකස් කර 2022 ජුනි 17 වැනි දින JICA වෙත එකගතාව සඳහා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හරහා ඉදිරිපත් කර ඇත. අවාසනාවකට ටෙන්ඩරය ප්‍රකාශයට පත් කිරීමට තවමත් අනුමැතිය ලැබී නොමැත. විගණන විමසුමේ සඳහන් කර ඇති පරිදි උපදේශන සේවාවේ මූල්‍ය ප්‍රගතිය නිවැරදිය. ණය ලබා දීම අත්හිටුවීම හේතුවෙන් භෞතික ප්‍රගතිය 30% මට්ටමේ පවතී. | අපේක්ෂිත ප්‍රගතිය ලබා කර ගැනීමට ක්‍රියා කළ යුතුය. |
| (ඇ) | 2020, 2021 සහ 2022 වර්ෂවලදී ජපන් ණය දෙන ආයතනය විසින් ලබා දීමට එකඟ වූ යෙන් මිලියන 10,639 ක ණය ආධාර මුදලින් යෙන් මිලියන 243 ක් පමණක් භාවිතා කර ඇත. භාවිතා කරන ලද මුදල ලබා දීමට නියමිත මුළු මුදලින් සියයට 2.78 ක් වූ ඉතා අඩු අගයකි. | 2020, 2021, සහ 2023 දී උපදේශන සේවා පමණක් ක්‍රියාත්මක විය. ණයෙහි මුළු මුදල උපදේශකයින්ගේ ගෙවීම් සඳහා පමණක් භාවිතා කරන ලදී. එබැවින් ණය වියදම ණය මුදලින් 2.78% ක් පමණි. (යෙන් මිලියන 10639) . නමුත් භෞතික ප්‍රගතිය සතුටුදායක මට්ටමක පවතී. සැලසුම් කර ඇති පරිදි ඉදිකිරීම් සහ උපකරණ ස්ථාපනය කිරීම ආරම්භ කිරීමත් සමඟ ප්‍රගතිය සැලකිය යුතු ලෙස වැඩි වනු ඇත. අවසාන පරිශීලකයින් සහ පාලන ආයතන සමඟ විස්තීර්ණ සැලසුම් සකස් කිරීම හේතුවෙන් දිගු සැලසුම් කාලසීමාව ජපාන රජය විසින් අරමුදල් සපයන ව්‍යාපෘතිවල සාමාන්‍ය ලක්ෂණයකි. | අපේක්ෂිත ප්‍රගතිය ලබා කර ගැනීමට ක්‍රියා කළ යුතුය |

## 3.3 මතභේදාත්මක ගනුදෙනු

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් එකක් රුපියල් 173,000 බැගින් වූ පරිගණක 04 ක් මිලදී ගැනීමට නිර්දේශ කර තිබුණු අතර ප්‍රසම්පාදන කමිටු අනුමැතිය ලැබී තිබුණි. ව්‍යාපෘති අධ්‍යක්ෂවරයාගේ අංක JICA/HAMSIP/12/2019 සහ 2020 දෙසැම්බර් 22 දිනැති ලිපිය මඟින් සතියක් ඇතුළත මෙම පරිගණක ලබා දෙන ලෙස අදාළ ආයතනයට දැනුම් දී තිබුණද, 2021 මැයි 18 දින පරිගණක සපයා තිබුණි. නමුත් ප්‍රමාදය සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. නියමිත පිරිවිතරයන්ට අනුව පරිගණක සපයා තිබේදැයි පරීක්ෂා කර නොතිබූ නමුත් 2021 ජුලි 22 දිනැති ව්‍යාපෘති අධ්‍යක්ෂකගේ ලිපිය මගින් DVD Drive 04ක් සපයා නොමැති බව සැපයුම්කරුට දන්වා තිබුණි. නමුත් 2021 අගෝස්තු 11 දිනැති අංක 100 දරන වවුචරය මගින් සැපයුම්කරුට රුපියල් 692,000ක් ගෙවා තිබුණි. | මෙම පරිගණක ප්‍රසම්පාදන කාලය තුළ Covid 19 වසංගතය රට පුරා ව්‍යාප්ත විය. රාජ්‍ය අංශයේ සහ පෞද්ගලික ආයතනවල බොහෝ කාර්යාල අත්‍යාවශ්‍ය කටයුතුවලට පමණක් සීමා විය. නිවසේ සිට වැඩ කිරීමට හෝ සතියකට සීමිත දින ගණනකට සහභාගී වන ලෙස රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය උපදෙස් දී තිබුණි. තැපැල් සේවය සාමාන්‍ය පරිදි ක්‍රියාත්මක නොවීය. සමහර ආයතන අමුත්තන්ට ඔවුන්ගේ සේවාවන් ලබා ගැනීමට ඇතුළු වීමට ඉඩ දුන්නේ නැත. ජාත්‍යන්තර භාණ්ඩ ප්‍රවාහනයට දැඩි ලෙස පහර වැදී ඇති අතර සමහර රටවල් විසින් අවසර නොදෙන ලදී. නව කොවිඩ් ප්‍රභේද ඇතුළුවීම වැළැක්වීම සඳහා ශ්‍රී ලංකාව නීති කිහිපයක් පනවා ඇත මෙම අයිතමය ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය නොකරන අතර එය ආනයනය කිරීමට සිදුවේ. ව්‍යාපෘති කළමනාකරණ ඒකකය සැපයුම්කරුවන්ගේ නිලධාරීන් සමඟ අඛණ්ඩව සම්බන්ධ වූ අතර ප්‍රමුඛ අවශ්‍යතාවයක් වූ බැවින් මෙම අයිතම ලබා ගැනීමට උපරිම උත්සාහයක් ගන්නා ලදී. අවාසනාවකට, ලෝකයේ හිතකර නොවන රෝග තත්ත්වය හේතුවෙන් සාර්ථකත්වයක් නොතිබුණි. නොයෙකුත් වාචික සාකච්ඡාවලට අමතරව, PMU විසින් 2021 ජනවාරි 08 සහ 2021 පෙබරවාරි 11 යන දිනවලදී අදාළ සැපයුම්කරුට ප්‍රමාදයකින් තොරව ඇණවුම සපයන ලෙස දැනුම් දෙන ලදී. සැපයුම්කරු ඔවුන්ගේ දුක්ගැනවිලි නැවත නැවතත් දන්වා ඇති අතර පවතින තත්වය පැහැදිලි කර ඇත. | මේ ගැන සොයා බලා ඒ අනුව අවශ්‍ය පියවර ගත යුතුයි |
| (ආ) | වැට් බදු සඳහා ලියාපදිංචි වී නොමැති තාක්ෂණ උපදේශන සේවා සපයන ආයතනය වෙත 2020 වසරට අදාළව උපදේශන සේවා ගාස්තු ගෙවීමේදී වැට් බදු ලෙස රු. මිලියන 13ක් ගෙවා තිබුණි. මෙම ගෙවීම සඳහා ඉදිරිපත් කළ ඉන්වොයිසිවල වැට් බදු අංකය පොරොත්තු වන බව සඳහන් කර තිබුණි. | 2020 උපදේශන සමාගම දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට වැට් බදු ලියාපදිංචි ලේඛන භාර දී තාවකාලික පුද්ගලික හැඳුනුම් අංකයක් (PIN) ලබා ගත්තේය. COVID හේතුවෙන් ඔවුන්ට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට සම්බන්ධ වීමට නොහැකි විය. ව්‍යාපෘති කළමනාකරණ ඒකකයක් ලෙස අපි දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සම්බන්ධ කර ගැනීමට උත්සාහ කළෙමු. අපි කිහිප වතාවක්ම උත්සාහ කළ නමුත් එය අසාර්ථක විය. උපදේශන සමාගම VAT ඉල්ලමින් ලිපියක් | ගෙවීම් කිරීමට පෙර සියලුම ලියකියවිලි සත්‍යාපනය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | ඉදිරිපත් කළ අතර උපදේශකයාගේ නමට (KRC) VAT චෙක්පත් ලබා ගැනීමට ඉල්ලුම් කළේය. GOSL අරමුදල් සුරක්ෂිත කිරීම සඳහා, අපි ඉල්ලූ පරිදි වැට් චෙක්පත නිකුත් නොකළෙමු. නමුත් ගිණුම්කරණ කාර්යය සඳහා සහ ව්‍යාපෘති ප්‍රගතිය සාර්ථකව පවත්වාගෙන යාම සඳහා අපි එය දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල්වරයාට නමට ලියා අපගේ මුදල් පොතේ තබා ගත්තෙමු. අපි නිසි වැට් අංකයක් ගැන දැඩි සැලකිල්ලක් දැක්වූ අතර උපදේශන සමාගම වෙත කිසි විටෙක වැට් චෙක්පතක් ගෙවා නැත. 13,037,608.48 ක මුදල නොගෙවූ චෙක්පත් ලෙස පවතී. | |
| (ඇ) | උපදේශන සේවා ගිවිසුම අවසන් කිරීම පිළිබඳ සේවා ගිවිසුමේ විධිවිධාන සඳහන් නොවීම හේතුවෙන් ඒ සම්බන්ධයෙන් අවශ්‍ය නීති උපදෙස් ලබාගැනීමට හෝ කාර්ය සාධන බැඳුම්කරය සම්බන්ධව අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි. | ව්‍යාපෘතිය අඛණ්ඩව පවත්වාගෙන යාම සහ ණය ලබා දීම සම්බන්ධයෙන් පවතින අවිනිශ්චිතතාවය හේතුවෙන්, ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් 2022 නොවැම්බර් 04 දිනැති ලිපිය මගින් උපදේශන කොන්ත්‍රාත්තුවේ ක්‍රියාකාරීත්වය සහ ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් පිළිබඳව මුදල් අමාත්‍යාංශය වෙත පිටපත් සමඟ සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත දන්වා ඇත. තවද, එය 2022 නොවැම්බර් 27 වැනි දින ව්‍යාපෘති මෙහෙයුම් කමිටු රැස්වීමේදී සාකච්ඡා කර ඇත.<br>අන්‍යෝන්‍ය එකඟතාව මත උපදේශන කොන්ත්‍රාත්තුව අවසන් කිරීමේ හැකියාව, උපදේශන කොන්ත්‍රාත්තුවේ කාර්ය සාධන බැඳුම්කරයේ වටිනාකම සහ උපදේශන කොන්ත්‍රාත්තුවට අදාළ ණයවර ලිපිය (කාල රාමුව) සෞඛ්‍ය ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් පැවති සාකච්ඡාවේ දී සාකච්ඡා කරන ලද අතර සෞඛ්‍ය අමාත්‍යාංශයේ නීති ශාඛාවේ ප්‍රධානියා ඊට සහභාගී විය. මෙය ව්‍යාපෘතිය අවසන් කිරීමක් නොවන බැවින් ඉහත විෂය සම්බන්ධයෙන් කටයුතු කිරීමේ වගකීම සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් භාරගෙන ඇත. ව්‍යාපෘති කළමනාකරණ ඒකකය උපදෙස් සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ නීති ශාඛාව වෙත ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත. | ගිවිසුමට සියලුම නීති සහ කොන්දේසි ඇතුළත් කළ යුතුය. |

## 3.4 පද්ධති හා පාලනයන්

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වසරේ අවසන් කාර්තුව සඳහා මහනුවර, අනුරාධපුර සහ කුරුණෑගල රෝහල් සඳහා සකස් කරන ලද ව්‍යාපෘති තත්ව වාර්තාව (PSR 2021) අනුව, වසරකට රෝගී මරණ 134,000 ක් පමණ වාර්තාවන අතර ඉන් සියයට 40 ක් හෘද වාහිනී රෝග හේතුවෙන් සිදු වේ. ඒ අනුව නියමිත කාලයට මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවීම හේතුවෙන් රෝගීන් මියයාම තවදුරටත් ඉහළ යන බවත් ඒ ආශ්‍රිත සෞඛ්‍ය ගැටලුවලට මුහුණ දීමට සිදු විය හැකි බවත් නිරීක්ෂණය විය. | මෙම ප්‍රකාශය සම්පූර්ණයෙන්ම වලංගු වේ. මෙම දත්ත කාර්තුමය වශයෙන් ප්‍රකාශයට පත් කරන ලද ව්‍යාපෘති තත්ව වාර්තාවේ (PSR) අන්තර්ගතයෙන් ලබාගෙන ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් සියලුම පාර්ශවකරුවන් වෙත බෙදා හරින ලදී. ව්‍යාපෘතිය නිම කිරීමේ ප්‍රමාදය රටේ හෘද වාහිනී රෝග ඇති රෝගීන්ට අහිතකර බලපෑමක් ඇති කරයි. මරණ අනුපාතය වැඩි වනු ඇත. බදුල්ල වැනි දුර බැහැර ප්‍රදේශවල සිට ප්‍රධාන රෝහල්වලට (පහසුකම් ඇති) රෝගීන් ප්‍රවාහනය කිරීමට රජයේ වියදම් ඉහළ යනු ඇත. ව්‍යාපෘතිය අත්හිටුවීම සහ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය 2023 අප්‍රේල් 30 වැනි දින අවසන් කිරීම මගින් හදිසි හෘද රෝග ප්‍රතිකාර ලැබිය යුතු අහිංසක ජීවිත බේරා ගැනීමේ අවස්ථාව අහිමි වනු ඇත. | ව්‍යාපෘතිය නියමිත කාලයට අවසන් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුයි. |